# ගුවන්විදුලිය

(සන්නිවේදනාත්මක ලිපි සමුච්චය)



.54
N

සේන නානායක්කාර

33254
Pa.

Koha
LIBRARY SYSTEM

RAJMNLIB
33254

# ගුවන් විදුලිය

## සන්නිවේදනාත්මක ලිපි සමුච්චය


## සේන නානායක්කාර.

B. A. (ගෞරව), M. A. (ලංකා)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය

ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය



**ගොඩගේ සහ සහෝදරයෝ**

නො: 675,

පී.ද.එස්. කුලරත්න මාවත,

කොළඹ 10,



| ප්‍රවේශ අංකය | 33254 |
|---|---|
| වර්ග අංකය | 384.54 NAN |

# පෙරවදන

ගුවන්විදුලිය වූ කලී අතිශය විශ්මයජනක වූ විද්‍යුත් මාධ්‍යය කි. එමෙන්ම, එය අදත් සමස්ත මානව වර්ගයා හා ඓන්ද්‍රියව බද්ධ වෙමින් එකී සමාජ සංවර්ධනය කෙරෙහිලා අඩු වැඩි වශයෙන් දායකත්වය සපයන පොදුජන සන්නිවේදන කාරකය කි. නමුත්, නූතන තාක්ෂණය හා ගොඩනැගෙමින් පවත්නා විශ්වගම්මාන සංකල්පයට සාපේක්ෂව නම්, ගුවන්විදුලිය යනු ක්‍රමයෙන් අඩු සැලකිල්ලට බඳුන් වෙමින් පවත්නා ගැමි ජන මෙවලමක් පමණෙකි යි සමහරෙක් විශ්වාස කරති.

මෙහි සත්‍යාසත්‍යතාව කෙලෙසක වුව ද, දියුණු වෙමින් පවත්නා රටවල බහුතරයක් වූ ගැමි ජනතාවට තම ගුවන්විදුලිය තාමත් ඔවුන්ගේ අතිජාත ජීවන සහකරුවා වෙයි. ඉන්ද්‍රජාල මැවුම් මවන රූපවාහිනී යන්ත්‍ර කෙසේ වතු දු, වෙලට, පැලට, හේනට, කුඹුරට යන ගැමි ගොවි ජනයා තමන් සන්තකව ඇති කුඩා ගුවන්විදුලි යන්ත්‍රයත් එල්ලා ගෙන යන්නට අමතක නොකරති. දහවලට කැලේ කොළේ, මහ පොළොව හා සතා සීපාවා සමඟ ඔට්ටු වී අඳුරට මුවාවෙන ඔවුහු සිය ඇඟපත විඩාව හා අත් පා කෙඩෙත්තුව තුනී කර ගන්නේ රේඩියෝවට පින් සිදුවන්නට යි. දේශ දේශාන්තරයෙහි කෙසේ වෙතත් උපන් බිමේ විත්ති උඩින් පල්ලෙන් හෝ දැන කියාගන්නේ ඒ ඇසුර නිසා ය.

මේ අයුරින් ගුවන්විදුලිය තොරතුරු සම්පාදනයේ ත්, ද්විතීය අධ්‍යාපනකරණයේ ත්, පෙළඹවීමේ හා විනෝදාස්වාද සම්පාදනයේ ත් බල සම්පන්න වාහකයක් වෙයි. එබඳු මාධ්‍යයක විවිධ පැතිකඩ ගෙන හාරා අවුස්සා සොයා බලා ඒ සම්බන්ධ සාහිත්‍යයක් ගොඩනැංවීමට අංශු මාත්‍රයකින් හෝ දායකවීම මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමෙහි ප්‍රමුඛතම අද්‍යාශය යි. එකී සද්කාර්යය අබමල් රේණුවක තරමින් හෝ මෙමගින්

ඉටුකරලන්නට මා සමත් වී නම්, එහි පූර්ණ ගෞරවය හිමි විය යුත්තේ මෙකී ග්‍රන්ථය සකසන්නට මට අත්උදව් සැපයූ සුහදශීලී මනුෂ්‍යයින්ට යි.

පළමුව, මෙබඳු අධ්‍යයන කාර්යයන් කෙරෙහි ලා තිබඳ අප මෙහෙයවන කැලණිය විශ්වවිද්‍යාලයීය ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් හා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය කේ.ඩී. පරණවිතානයන් මෙන්ම, සංචාරක හා ගුවන් සේවා අමාත්‍යාංශයේ හිටපු මාධ්‍ය උපදේශක ආචාර්ය නන්දන කරුණානායකයන් ද ගෞරව බහුමානයෙන් හර සර පෙරදැරිව සිහිපත් කරමි.

දෙවනුව, අප කාටත් ශක්තිමත් අත්වැලක් වන් දේශබන්ධු සිරිසුමන ගොඩගේ සූරින් නොසිටින්නට මෙය තවදුරටත් අත් පිටපතක් ලෙසම මගේ පොත් රාක්කයේ හුදකලා වනු නිසැක ය. කිසිදු ලාභාපේක්ෂාවකින් තොරව මෙය ප්‍රකාශයට පත් කිරීමේ වගකීම බාරගත් එතුමන්ට පින් පතමි. ඒ සමගම යතුරු ලියනයෙන් සුහදශීලී සහාය පළ කළ ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයීය පුස්තකාලයේ ශිරෝමිකා මාදම්පගේ හා අනෝමා ප්‍රියංකා යන සොහොයුරියෝ ද, අනුරාධපුර විමල් මුද්‍රණාලයේ ආනන්ද විජේකෝන් සොහොයුරා ඇතුළු කාර්ය මණ්ඩලය ද ඒ අතර වෙති. එපමණක් නොව, දහසක් දුෂ්කරතා මැද සවි සිඳුනු කල, යළි යළිත් මා නැඟී සිටුවා, දිරිමත් කරමින් මහ නොමහ පෙන්වූ ඇය, මගේ ආදරණීය සුද්දි....! ඔබ ද ඒ අතර වන්නී ය. ඔබ සියලු දෙනාට සෙනෙහස සපිරි ස්තුතිය පුදමි.

**සේන නානායක්කාර.**

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ.

| පටුන | පිටුව |
| --- | --- |

පිදුම

පෙරවදන

පටුන

**පිවිසුම** — 11 - 13
(හඬ-විදුලි පෙරළිය)

**ගුවන්විදුලි මාධ්‍යයේ ප්‍රභවය, ව්‍යාප්තිය හා එහි වර්ධනීය අවස්ථා** — 14 - 26
(ඉතිහාසයක පිබිදීම)

**ලංකා ගුවන්විදුලියේ ආරම්භය, ව්‍යාප්තිය හා එහි සුවිශේෂ සන්ධිස්ථාන** — 27 - 49
(කොළඹින් කතා කරමි)

**ගුවන්විදුලි මාධ්‍යයේ ප්‍රබලතා, ඌනතා හා සීමා.** — 50 - 63
(පනින්න පෙර සොයා බලනු ! )

**ගුවන්විදුලි මාධ්‍ය, පිටපත් රචනය හා එහි කේන්ද්‍රීය සුවිශේෂතා** — 64 - 74
(ගුවනට ලියමු ! )

**වැඩසටහන් නිෂ්පාදනය, නිෂ්පාදකයා හා ඔහු සතු කාර්යභාරයන්** — 75 - 86
(දැන ගියොත් කතරගම...නොදැන ගියොත්........?)

**ගුවන්විදුලි නිවේදකයා හා සන්නිවේදන කාර්යය** — 86 - 98
(දැලි පිහියෙන් මී කිරි කෑම)

**ශ්‍රවණ පර්යේෂණ පිළිබඳ සන්නිවේදනාත්මක විග්‍රහය** — 99 - 118
(සූප ශාස්ත්‍රයක රස ගුණ සෙවුම)